3 වන පිටුවෙන් (කරන්ට් නොවැදී)

අර්බුදය ලිහීමට ප්‍රධාන බාධකයක්ව ඇත්තේත් විදුලිබල මණ්ඩලයමය.

විදුලි බල මණ්ඩලය පිහිටුවනු ලැබුයේ මහා බ්‍රිතාන්‍යය එවකට අනුගමනය කළ රාජ්‍ය සමාගම් ආකෘතිවලට අනුව රාජ්‍ය ව්‍යවසායක් හැටියට 1969 දී ය. මහා බ්‍රිතාන්‍යයේ මෙන් නොව ශ්‍රී ලංකාවේදී රාජ්‍ය ව්‍යවසායයක් හෙවත් රාජ්‍ය සමාගමක් ඉතා ඉක්මනින් කිලුටු වී දූෂිත වන්නේය. ඒ සමාජවාදී දේශපාලන ආකල්ප නිසාය. රාජ්‍ය ව්‍යවසායයක්, කලින් කලට බලයට පත්වන දේශපාලනඥයන් විසින් සලකා බලනුයේ එය තම තමන්ගේ තාවකාලික දේපලක් හැටියටය. එහෙත් මහජනයා එය සිය පොදු දේපලක් යැයි වරදවා වටහාගෙන සිටී. කෙසේ වුවත් භාවිතයේ දී සිදු වන්නේ එ මගින් දේශපාලනඥයන් තම දේශපාලන අරමුණුත් පෞද්ගලික අරමුණුත් ඉටු කර ගැනීමය. බ්‍රිතාන්‍ය සංකල්පයට අනුව නම් රජය මැදහත් වනුයේ ප්‍රතිපත්තිමය තීරණවලට පමණක් වුවත් ශ්‍රී ලංකාවේදී රාජ්‍ය ව්‍යවසායයන්ගේ කළමනාකරණ කටයුතුවලටත් රජය මැදිහත්වීම සිදු කෙරේ. කළමනාකරුවන් මෙන්ම උසස් නිලධාරීන් එහි සේවකයන් ද බලයේ සිටින ආණ්ඩුවේ ආකල්ප සමඟ එතී සිටිනා අතරම විදුලිය බල මණ්ඩලයේ ප්‍රතිපත්තිමය කාරනා සමග තම තමන්ගේ පෞද්ගලික පරමාර්ථ මිශ්‍ර කරති. මේ නිසාම විදුලිබල මණ්ඩලය පුලුල් ලෝක දෘෂ්ඨියකින් විදුලිය බල අර්බුදය දෙස නොබලයි. රාජ්‍ය සමාගම් සංකල්පය අපට හඳුන්වා දුන් මහා බ්‍රිතාන්‍යයම එම සංකල්පය අතහැර තම ආයතන නවීනත්වයට පත් කරගෙන ඇත. මාග්‍රට් තැචර් අග්‍රාමාත්‍යතුමියගේ පාලන කාලයේදී එරට වාමාංශික වෘත්තිය සමිති හා දේශපාලන පක්ෂත් ඒවායේ ප්‍රචාරකයන්ගෙත් දැඩි විරෝධය මැද්දේ රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යූහ ගත කෙරින. මේ ආකාරයට 1990 - 91 විදුලි බලයද 1981 දී බ්‍රිටිෂ් එරෝ ස්පේස් හා කේබල් ඇන්ඩ් වයර්ලස් ද 1984 දී බ්‍රිටිෂ් ටෙලිකොම් ද 1986 දී බ්‍රිටිෂ් ගෑස් ද 1987 දී බ්‍රිටිෂ් එයාර් වේස් ද 1988 දී බ්‍රිටිෂ් ස්ටීල් ද 1989 දී බ්‍රිටිෂ් වෝටර් යුටිලිටීස් ද 1995 දී බ්‍රිටිස් කෝල් ද 1996 දී බ්‍රිටිෂ් රේල්වේ ද ප්‍රතිව්‍යූහ ගත කෙරින. ඊට එරෙහිව ගොඩ නැගුණු විරෝධය ප්‍රතිඵල ලැබෙනවිට ක්‍රමයෙන් වාෂ්ප විය.

රාජ්‍ය සමාගම් සංකල්පයට සමාජවාදයෙන් හෝ ධනවාදී නොවන එක්තරා පොදු පිළිගැනීමක් පාදකවී ඇත. අහස - අයන ගෝලය - විදුලි බලය - ජලය - මහා මාර්ග - දුම්රිය ආදී දේ ස්වභාවික ඒකාධිකාර වශයෙන් පැවැතිය යුතුය යන අදහසයි. එහෙත් විදුලියබලය සම්බන්ධව නවීන ලෝකයේ ආකල්පය අද වන විට බෙහෙවින් වෙනස් වී තිබේ. විදුලිය රැ හැන් පවත්වා ගෙන යාම පමණක් ඒකාධිකාරයක් ලෙස සැලකුවත් විදුලිය නිපදවීමේ ක්ෂෙත්‍රයත් බෙදාහැරීමත් තරඟකාරීව පවතින්ට ඉඩදීම වර්තමාන පිලිවෙලය. එහෙත් අප සිටින්නේ පුරාණ ආකල්ප වලය. තුන්වන ලෝකයේ බොහෝ රටවල් ද මෙබඳුම වූ තත්ත්වයක පසුවන බැවින් ඔවුන් ද විදුලිය බලය නිපදවීමෙහි ලා සිටින්නේ අඩුම කාර්යක්ෂම තාවයකය. ඉතිහාසය ගැනත් අතීතය ගැනත් දැඩි ඇල්මක් ඇති නිසාදෝ අභියෝග ජය ගැනීමේ නව ලෝක අත්දැකීම් කෙරෙහි අප දක්වන උනන්දුව අල්පය. අප සොයන්නේ අතීතයට යාම සඳහා පාරවල්ය.

විදුලිබලය භාණ්ඩයක් වශයෙන් සලකා එය නිපදවීම නිදහස් තරඟකාරී වෙළෙඳපොල තුළ පිහිටුවීම විදුලි බලය මිල අඩු කර ගැනීමේත් කාර්‍යක්ෂමතාවය වැඩිකර ගැනීමේත් ක්‍රමවේදය බව දියුණු ලෝකයේ පිළිගැනීමය. එංගලන්තය - ඕස්ට්‍රේලියාව - ජපානය - කොරියාව - මහජන චීනය - මැලේසියාව පමණක් නොව ඉන්දියාව ද අනුගමනය කරන පිළිවෙල එයය. රාජ්‍ය ඒකාධිකාරයකට මෙම වැඩපිළිවෙලට අතුලත් වියහැකි නමුත් එහි පැවැත්ම කල් පවතින්නේ නැත. නිදහස් තරඟය යටතේ ස්වභාවික වාරණය එනම් තමන්ගේ දේපලක් නොවේයැයි යන සිතිවිල්ල නිසා අකාර්යක්ෂම ආයතන පිරිහීම ස්වභාවික දෙයක් බැවිනි. එහෙත් මෙහිදී රාජ්‍ය ඒකාධිකාරයට එක්තරා වැදගත් කාර්ය භාරයක් නැතිවාම නොවේ. ඒ විදුලි බලය ප්‍රවාහනය කරනා රැහැන් පද්ධතිය නඩත්තු කරමින් රැක බලා ගැනීමය. විදුලි බල ප්‍රතිසංස්කරණ යටතේ වුවද මෙම රැහැන් පද්ධතිය නඩත්තු කිරීමේ කාර්යය අධිකාරියක් යටතේ පවත්වාගෙන යා යුතුය. පෞද්ගලික විදුලිබලය නිෂ්පාදකයනුත් බෙදාහරින්වුනුත් අධිකාරිය යටතේ ඇති මෙම රැහැන් පද්ධතියට ගෙවීමෙන් තම ව්‍යාපාර කටයුතු තරඟකාරීව කරගෙන යාම පිළිගත් ක්‍රමවේදයයි.

නිදහස් තරඟ බිමකදී නිෂ්පාදකයා කාලීන වශයෙන් අලුත්වන තාක්ෂණය හා ක්‍රමවේද වහාම යොදා ග නිමින් තරඟ බිම තුළ තම පැවැත්ම සහතික කරගත යුතුය. නැතහොත් තමන්ට සමාන්තරව අනෙක් නිපදවන්නා තමා පසුකොට ඉදිරියට ගිය කළ තමන්ට පාරිභෝගිකයන් අහිමිවන බව නිෂ්පාදකයා දනී. එහෙත් ඒකාධිකාරියක් වශයෙන් පවතින විදුලි බල මණ්ඩලයට අර අන්දමේ අභියෝගයක් ඇත්තේ නැත. මන්ද කියනවා නම් විදුලිය බල මණ්ඩලය කුමන මිලකට කවර මට්ටමේ හෝ බාල විදුලිය සැපයුමක් ලබා දුන්නත් පාරිභෝගිකයා එය බාර ගතයුතු නිසාය. කාගේ විදුලි බලයක් වැඩියෙන් හොඳ දැයි කියා බලන්නවත් පාරිභෝගිකයාට අධිකාරියක් යටතේ නොහැකිය. ඉතින් විදුලිය කියන්නේ මෙන්න මේකට තමයි කියා මණ්ඩලය කියන දෙයක් අසා නිහඬව සිටීමට පාරිභෝගිකයන්ට සිදුවේ. විදුලි බලය නිපදවීමත් බෙදා හැරීමත් පෞද්ගලික ව්‍යවසායකයකයන් කළහොත් ඒ තැන් සිට මණ්ඩලයේ විදුලි බලය පරීක්ෂාවට ලක්වනු ඇත. මණ්ඩලයේ ප්‍රධානීන් දැනට තෙපලන කතා ද ඒ සමග ම පරීක්ෂාවට ලක්වනු ඇත පාරිභෝගිකයාට තමන් කැමති විදුලිබලයක් තෝරා ගැනීමට අවස්ථාවක් ලැබෙනු ඇත. මෙහිදී දැනට ක්‍රියාත්මක වන ලංකා

තතු මෙසේ වුවත් වාමාංශික පක්ෂ සමඟ ආණ්ඩුව කියා සිටින්නේ රාජ්‍ය ඒකාධිකාර ප්‍රතිව්‍යූහගත කළහොත් එනම් පෞද්ගලික ව්‍යවසායයන් හවුල් කරගත හොත් ඒවායේ සේවාවන් හෝ නිෂ්පාදන මිල ගණන් ඉහළ යා හැකි බවය. එම කියමනේ ඇත්තක් බැලූ බැල්මට නැතිවා ම නොවේ. නමුත් නියම ඇත්ත ඇත්තේ ඔවුන් කියන ඇත්තට තරමක් පිටුපසින්ය. විදුලිය බල මණ්ඩලය ගත් කළ රාජ්‍ය සහනාධාර මත පවතින ආයතනයක් බවත් එම සහනාධාර වූ කලී මහජනයාගෙන්ම අය කර ගන්නා මුදලක් බවත් ඔවුන් කියන්නේ නැත.

විදුලි පෞද්ගලික සමාගම (එල්ඊසීඕ) විදුලිබල මණ්ඩලයට තරඟකරුවකු නොවේදැයි යනුවෙන් යමෙකුට සිතෙන්නට පිළිවන. එහෙත් මෙය පෞද්ගලික සමාගමක් ම නොවේ. එය 1984 දී හිටපු ජනාධිපතිවරයෙකු වන රණසිංහ ප්‍රේමදාස මහතා විසින් නිශ්චිත ප්‍රදේශයක විදුලිබලය බෙදා හැරීම සඳහා ඒකාධිකාරියක් වශයෙන් ක්‍රියාත්මකවීමට පිහිටුවනු ලැබූ සමාගමකි. එයින් නිදහස් තරඟ කාරීත්වය අර්ථවත් වන්නේ නැත. මෙම සමාගම සමාගම් පනත යටතේ ලියා පදිංචි කර තිබුණ ද මෙහි හිමිකරුවන් වන්නේ ලංකා විදුලිබල මණ්ඩලයත් නාගරික සංවර්ධන අධිකාරිය හා මහා භාණ්ඩාග ාරයත් ය. එනම් අවසාන විග්‍රහයේ දී රජයමය.

රජය යටතේ වුවද මෙය ක්‍රියාත්මක වන්නේ සමාග මක් ආකාරයෙන් බැවින් කාර්යක්ෂමතාවය අතින් විදුලිබල මණ්ඩලයට වඩා ඉහළින් තිබීම සැලකිල්ලට ගතයුතුය. එබඳු සමාගමක් පවා විදුලිබල මණ්ඩලයට යම් තරඟකාරීත්වයක් එල්ල කරන බැවිනි. එහෙත් බලශක්ති ක්ෂෙත්‍රයේ පවතින අර්බුදයට මෙය විසඳුමක් නම් නොවේ.

විදුලිය බලය නිෂ්පාදන කාර්යයේදී පමණක් නොව කළමනාකරණයේදී ද පෞද්ගලික නිෂ්පාදකයා සහ මණ්ඩලය කටයුතු කරනුයේ ප්‍රතිවිරුද්ධ ආකාරයකටය. තමන්ට තරඟකරුවකු නොමැති තත්ත්වය යටතේ ඒකාධිකාරයක් වන මණ්ඩලය සිය කළමනාකාර කටයුතු මෙහෙයවනු ලබන්නේ මන්දග ාමීවය නැතහොත් දේශපාලන අරමුණු ඇතිවය. විදුලි බල මණ්ඩලයට කුමක් වුවත් එහි පාලකයාට හෝ දේශපාලන නායකත්වයට එමගින් පෞද්ගලික පාඩුවක් නොමැත ඒ නිසා පෞද්ගලික නිෂ්පාදකයා මෙන් අව්‍යාජව තීරණ ගනිමින් ව්‍යවසායය බේරා ග ැනීමට කටයුතු කරන්නේ නැත. ලෝකයේ සෑම තැනම රාජ්‍ය ඒකාධිකාරවල තත්ත්වය අඩු වැඩි වශයෙන් මෙබඳුම ආකාරයක් ගෙන ඇති බැවින් ජාත්‍යන්තර මූල්‍ය ආයතන රාජ්‍ය ඒකාධිකාරවලට ණය දීමට මැලිවෙයි. මන්ද කියනවා නම් ලබා ගන්නා ණය ආපසු ගෙවීමට මෙම ආයතනවලට හැකියාවක් ඇතැයි විශ්වාසයක් ණය දෙන ආයතනවලට නොමැති නිසාය. ලංකාවේ විදුලිබල මණ්ඩලය ද දැනට පවතින්නේ යම් අන්තරායදායක තත්තවයකය. (චීනය හා ජපානය ණය ලබා දුන්නේ නැත්නම් විදුලිබල මණ්ඩලය වසා දමන්නට සිදුවනු ඒකාන්තය.)

තතු මෙසේ වුවත් වාමාංශික පක්ෂ සමඟ ආණ්ඩුව කියා සිටින්නේ රාජ්‍ය ඒකාධිකාර ප්‍රතිව්‍යූහගත කළහොත් එනම් පෞද්ගලික ව්‍යවසායයන් හවුල් කරගත හොත් ඒවායේ සේවාවන් හෝ නිෂ්පාදන මිල ගණන් ඉහළ යා හැකි බවය. එම කියමනේ ඇත්තක් බැලූ බැල්මට නැතිවා ම නොවේ. නමුත් නියම ඇත්ත ඇත්තේ ඔවුන් කියන ඇත්තට තරමක් පිටුපසින්ය. විදුලිය බල මණ්ඩලය ගත් කළ රාජ්‍ය සහනාධාර මත පවතින ආයතනයක් බවත් එම සහනාධාර වූ කලී මහජනයාගෙන්ම අය කර ගන්නා මුදලක් බවත් ඔවුන් කියන්නේ නැත. ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙන් සහන මිලට ඉන්ධන ලැබෙන්නේ නැත්නම් ලංකා විදුලිබල මණ්ඩලය ලබාදෙන විදුලිය කෙතරම් ඉහළ මිලකට සපයනු ඇත්දැයි ඔවුන් කියන්නේ නැත. එම සහනාධාරය පෞද්ගලික ව්‍යවසායකයනට ලබා නොදෙන බැවින් දැනට පවතින මිල ඉහළ යනු ඇත. එහෙත් කල්යාමේදී තරඟකාරී මිල තත්ත්වය යටතේ සාපේක්ෂ වශයෙන් මිල අඩුවනු ඇත. වඩාත් කණග ාටුදායක කරණය නම් කිසිම දවසක විදුලි බලය පාවිච්චි නොකරන 35 - 40% පමණ වන දුගී ජනතාවද අර විදුලිය බල මණ්ඩලය නඩත්තු කිරීමේ සහනාධාර බර දරාගෙන සිටීමට සිදුව තිබීමය. විදුලිය බලයෙන් ප්‍රයෝජනයක් නොලබන එම ජනතාව විසින් විදුලිය බලය නඩත්තු කිරීම සාධාරණ වන්නේ කෙසේදැයි වාමාංශික සහෝදරවරු ඒ ජනතාවට පහදා දිය යුතුය. දුම්රියක් භාවිතා නොකර 70% පමණ වන ජනතාව දුම්රිය නඩත්තු කළ යුත්තේත් ලංගම සේවය නොලබන ජනතාව එය නඩත්තු කළ යුත්තේත් තැපැල් දෙපාර්තමේන්තුවෙන් සේවයක් නොලබන ජනතාව එය නඩත්තු කළ යුත්තේත් කුමන අර්ථයකට ද යන්න ඒ ඒ ආයතන 'ජාතික සම්පත' ක් යැයි කියන වමේ සහෝදරවරු සහ රාජ්‍ය කේන්ද්‍රීය ආර්ථික කළමනාකරණය අවශ්‍යයැයි කියන උදවිය පොදු ජනතාවට පහදා දිය යුතුය. කාටවත් ජාතික සම්පතක් වන දෙයක් තමන් කරගහගෙන ඉන්නේ කුමකට ද කියා දහසක් අඩුපාඩු දරා ගනිමින් ඒවා කර ගසාගෙන සිටින ජනතාව ද තේරුම් ගත යුතුය.

රාජ්‍ය ව්‍යවසායයන් වූ කලී ඒවා ස්වභාවිකවම පාරදෘශ්‍ය භාවයෙන් හා කාර්යක්ෂමතාවයෙන් සාපේක්ෂ වශයෙන් අඩුය. මන්ද ඒවායේ ලාබ පාඩු හා මෙහෙයුම් සොයා බලන්නට පෞද්ගලිකවම කැපවූ හිමිකරුවකු නොවීමය. ලාභය හෝ පාඩුව පෞද්ගලිකවම තමන්ට සිදුවන්නේ නම් පමණක් සංවේදී වීම මිනිස් ගතියකි. එය දේපල අයිතිය අන්‍යයන්ට නම් ඒ ගැන සැලකිල්ල දක්වන්නේ අඩුවෙනි. ඇතැම් විට ඇත්තේම නැත. අඩුම තරමින් එම කරුන අරබයා තමන්ට පෞද්ගලිකව වග කියන්නට හෝ බැනුම් අහන්නට වත් සිදුවේ නම් නැතහොත් නීතියෙන් දඬුවම් විඳින්නට වත් සිදුවේ නම් තමන් ට සෘජුවම බල නොපානා ලාභය හෝ පාඩුව ගැන යන්තමින් වත් සංවේදිවෙති. මෙය පෘත-ග්ජන මිනිසාගේ ස්වභාවයය. රාජ්‍ය ව්‍යවසායකයන්ගේ පාලකයන් ද පෘතග්ජන සමාජයේ මිනිසුන් බැවින් ඒවායේ සිදුවන අකාර්යක්ෂමතාවය දූෂණය හා නාස්තිය යනු ඔවුන්ගේ පෞද්ගලික අවගුණයක් ලෙස තේරුම් ගැනීම ඵල රහිතය. මෙබඳු නරක මනුෂ්‍යයන්ම පෞද්ගලික ව්‍යවසායක් තුළදී ඉඳුරාම මීට වෙනස්ව හැසිරෙන්නේ මන්ද යන්න මෙරට වාමාංශිකයන් හා ප්‍රතිපත්ති සම්පාදකයන් තේරුම් ගත යුතුය.

ගැලවීමේ මාර්ගයකුත්, දූෂණයක් කිරීමට අවස්ථා-වකුත් ඇත්නම් මනුෂ්‍යයෝ දූෂණයේත් වංචාවේත් යෙදෙති. වඩාත් දැන උගත් මිනිසා වඩාත් සූක්ෂම ආකාරයෙන් පසුබිම සුදුසු කළ දූෂණයනහි නිරතවෙති. ලේඛන ගත නීතියකින් ලිපි ලේඛන තුලින් ආවරණය සකසා ගත හැකි බැවින් පාරදෘශ්‍ය භාවයක් ඇතිවද රාජ්‍ය ව්‍යවසායයන් හා අරමුදල් දූෂණය කළ හැකි බව අප මෙහිදී තේරුම් ගත යුතුය. එවැනි අපරාධ ලිඛිත සාක්ෂි මඟින් අපරාධ හැටියට ඔප්පු කිරීමට බැරිවන සේ අදාල ආයතනය විසින්ම අවශ්‍ය කටයුතු කරන බැවිනි. ඉන්පසු නීතිය ඉදිරියට යාමෙන් ද වැඩක් වන්නේ නැත. රාජ්‍ය ආයතන මේ හැටියට මාෆියාවක් හෝ ක්‍රියාත්මක වීම තුන්වන ලෝකයේ අපවැනි රටවල සම්බන්ධයෙන් පවතින ස්වභාවික තත්ත්වයකි. රාජ්‍ය අංශය කුඩා කළ යුත්තේ මේ නිසාමයි ජාත්‍යන්තර ණය දෙන ආයතන රාජ්‍ය ව්‍යවසායයන් කෙරෙහි විශ්වාසයක් නොතබන්නේ එබැවිනි.

පෞද්ගලික ව්‍යවසාය තුළ රාජ්‍ය සමාගමක සිදුවන අපචාර ඒ ආකාරයෙන් සිදු නොවන්නේ තම ධනය තමන් විසින්ම වංචා කිරීම දූෂණ්‍ය කිරීම හෝ නාස්ති කිරීම පෘතග්ජන ගතියක් නොවන නිසාය. එසේ කළහොත් පෞද්ගලික ව්‍යවසාය වැනසී යනවා මිස එය රැක ගන්නට රාජ්‍ය ව්‍යවසායකදී මෙන් කිසිදු ආරක්ෂකයෙක් ඔවුන් පිටුපසින් සිට රැකවරණය සපයන්නේ නැත.

ලංකා විදුලි බල මණ්ඩලය පොදු දේපලක් වශයෙන් රැක ගත යුතු යැයි කියන උදවිය ප්‍රාග්ධන හිමිකාරත්වය මුල් කොටගෙන පැන නඟින ඉහත සඳහන් ගැටලු වළකන්නේ කෙසේද යන ප්‍රශ්නයට පිළිතුරු දිය යුතුය.

වර්තමානයේ රාජ්‍ය ව්‍යවසායයන්ට පෞද්ගලික ප්‍රාග් ධනය හවුල්කර ගැනීමේ යම් ප්‍රවණතාවයක් දකින්නට ලැබුනද නියාමන ආයතන මූලධර්මීය වශයෙන් වෙනසකට ලක් කරන්නේ නැතිව පෞද්ගලික ප්‍රාග් ධනයට ආරාධනය කිරීමෙන් එතරම් ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැත. මක් නිසාද කියනවා නම් එවැනි වෙනසක් ඇති නොකොට ගෙන්වන ප්‍රාග්ධන අයෝජන මිලෙන් අධික බැවින් එහෙත් එම මිල අධික ආයෝජන කෙරෙහි දේශපාලනඥයන්ගේ හා නිලධාරීන්ගේ අකමැත්තක් නැත. ඒ තමන්ගේ පංගුව ලැබේ නම් ඉන්පසු කුමක් වුවත් ඔවුනට ඉන් කරදරයක් ඇති වන්නේ නැති නිසාය. එහෙත් රටට අවශ්‍ය වන්නේ රටට පාඩුවක් නොවන පරිදි පොදු ජනතාව මත පාඩුවක් අලාභයක් පවරන්නේ නැතිව පෞද්ගලික ආයෝජන කැඳවා ගැනීමටය. මෙය කිරීමට නම් ආණ්ඩුවේ සෘජු බලපෑම නොමැති ස්වාධීන නියාමන (මෙහෙයුම්) ආයතනයක් පිහිටුවා තිබිය යුතුය. මෙයින් අදහස් කෙරෙන්නේ ව්‍යවසායකත්වයට නිදහස තිබිය යුතු බවයි. මහජන චීනය භූමියේ අයිතියත් ප්‍රාග්ධනයත් තම අතෙහි තබා ගනිමින් ව්‍යවසායකත්වයට ඉඩම් තිබේ. චීන බලධාරීන් කළමනාකරණයට ඇඟිලි ගසන්නේ නැත.

ආණ්ඩුවක් විසින් මෙහෙයවනු ලබන ආයතන වූ කලි ඒ ඒ කාලයට බලයට පත්වන දේශපාලන පක්ෂයේ වුවමනා මූලික කොට ගෙන ප්‍රතිපත්ති තීරය කැරෙන ආයතනයන්ය. ආණ්ඩුවෙන් ආණ්ඩුවට මේවායේ ප්‍රතිපත්ති ද වෙනස් වේ. එබැවින් රාජ්‍ය ව්‍යවසායයන් සමඟ එකට වැඩ කිරීමට පෞද්ගලික ආයෝජකයන් බියක් දක්වති. මෙබඳු ව්‍යාපෘති සඳහා ඉදිරිපත්වන ව්‍යවසායකයින් බලාපොරොත්තු වන වැදගත්ම කාරණය වන්නේ, අදාල රට තම ආයෝජනයට කොතරම් දුරකට හිතකරද යන්නය. පෞද්ගලික ආයෝජන සඳහා ප්‍රතිපත්ති සකස් කිරීමට රජයට ඇති ශක්‍යතාවය, මූලික අමු ද්‍රව්‍ය වන ඉන්ධන ලබා ගැනීමේ පහසුව තමන්ව මෙහෙයවනු ලබන්නේ (නියාමනය කරන්නේ) කෙබඳු ආයතනයක් ද යන්න ඇතුළු රටේ පවතින නීතියේ ආධිපත්‍ය කෙතරම් යහපත් ද ආදිය යන්නය. ඒ හැරුණ කළ ව්‍යවසායකයාට සලකන්නේ කෙසේද යන්න ද ඒ සමානවම වැදගත්ය.

මෙහිදී අදාල ක්ෂෙත්‍රය (විදුලි බලය) මෙහෙයවනු (නියාමනය) ලබන ආයතනයේ ස්වභාවය හා කවුරුන් ද යන්න මූලික වැදගත් කමක් දරයි. ශ්‍රී ලංකාවේ නම් වර්තමානයේ මෙම කාර්යය කරනුයේ විදුලිබල අමාත්‍යංශය විසිනි. මෙය ම නුසුදුසු කමකි. මන්ද කියනවා නම්, අමාත්‍යංශය යනු ඒ ඒ කලට බලයට පත්වන ආණ්ඩුවේ දේශපාලන වුවමනාව නියෝනය කරන ආයතනයක් බැවිනි. එනිසා ම එමගින් නිශ්චිත ප්‍රතිපත්ති හා තීරණ ගැනීම අවශ්‍ය පරිදි සිදු කිරීමක් හෝ සාධාරණත්වයක් බලාපොරොත්තු විය නොහැකි බව ආයෝජකයෝ අවබෝධ කොටගෙන සිටිති.

ව්‍යවසායකයෙකු අපේක්ෂා කරනුයේ එවැනි ප්‍රාථමික ග්‍රාම්‍ය නියාමනය කිරීමක් නම් නොවේ. ඊට යම් ස්වාධීනත්වයක් තිබිය යුතු බව මහා ධනස්කන්ධයක් ආයෝජනය කරන ව්‍යවසායකයෝ බලාපොරොත්තු වෙති. කිසියම් ආණ්ඩුවකට බද්ධ වූ ආයතනයක් ලෙස නොව සමස්ථ පාර්ලිමේන්තුවට වගකියන, අදාල විෂයය ගැන පළපුරුද්දක් හා වෘත්තීය සුදුසුකමක් ඇති අය ගෙන් සැදී යම් ස්වාධීනත්වයක් සහිත ආයතනයකි. එහෙත් අපේ රටේ නායකයන් මෙම සියුම් හා බැරෑරුම් යථාර්ථය තේරුම් ගෙන ඇත්ද යන්න සැක සහිතය.

මේ නිසා දේශපාලන මැදිහත් වීම්වලින් තොර කලින් කලට ප්‍රතිපත්ති වෙනස් නොකරන දේශපාලනඥයන්ගේ හිතවතුන් වෙනුවට වෘත්තීමය සුදුසුකමක් හා ප්‍රමාණික දැනුමක් ඇති අය විසින් මෙහෙයවනු ලබන ආයතනයක් ක්ෂෙත්‍රය නියාමනය කිරීමට ගොඩ නැගිය යුතුය. එහෙත් අවශ්‍යනම් රජයට ආයතන හිමිකරුවෙකු ලෙස තරඟකාරීව විදුලිබල ව්‍යාපාර ක්ෂෙත්‍රයේ රැඳී සිටීමට මෙමගින් බාධාවක් නැත. උදාහරණයක් ලෙස ගතහොත් තවදුරටත් විදුලිය බලය ජනනය කිරීමේ අංශය තවදුරටත් රජය සන්තකව පවත්වාගෙන යාමට හැකිය. නමුත් යටකී ස්වාධීන නියාමන ආයතනයේ නිර්දේශ හා නිර්නායකයනට යටත්ව ක්‍රියා කිරීමට විදුලිබල මණ්ඩලය සූදානම් විය යුතුය. මෙය විදුලිබල මණ්ඩලය සම්බන්ධව පමණක් නොව දුම්රිය - ග මනාගමන මණ්ඩලය හා අනෙකුත් රාජ්‍ය සමාගම් හා මණ්ඩල සම්බන්ධයෙන් කළ යුතු ප්‍රතිසංස්කරණ වලදී අනුගමනය කළ යුතු මූලධර්මීය පදනමකි. මේ ආකාරයට නියාමන ආයතනවල අධීක්ෂණය යටතේ රාජ්‍ය සහ පෞද්ගලික යන දෙපක්ෂයකටම තරඟකාරී ලෙස විදුලිබල ක්ෂෙත්‍රයට සම්බන්ධවීමට බාධාවක් නැත. ලෝකයේ හෝ කලාපයේ නිර්නායක ඇසුරින් අප රටේ නිර්නායකයන් කුමන ආකාරයක් ගතයුතු දැයි සලකා ඊට අනුකූලව රජයටත් පුද්ගලික අංශයටත් මෙම ක්ෂෙත්‍රයට ඇතුලු වී තරඟකාරීව රජයටත් පුද්ගලික අංශයටත් මෙම ක්ෂෙත්‍රයට ඇතුලු වී තරඟකාරීව ක්‍රියා කිරීමට හැකි ආකාරයෙන් මෙම නිර්නායකයන් සකස් කර ගත හැකිය. ප්‍රතිව්‍යූහ ගත කිරීමෙන් විදුලි බල මණ්ඩලය කැබලිවලට කැඩෙනවා යැයි කියා එහි වෘත්තීය සමිති හා වාමාංශික පක්ෂ කෑකෝ ගසති. එය සත්‍යයකි. එය කැබලි නොකොට ප්‍රතිව්‍යූහ ගත කිරීමේ පලක් නැත. එය එසේ නොකොට කාර්යක්ෂමතාවය නංවාලිය නොහැකිය. රාජ්‍ය බාධක හෙවත් ව්‍යවසායකයාගේ කාර්යයට ඇඟිලි ගැසීම ඉවත් කළ නොහැකිය. මෙම ඇඟිලි ගැසීම් හෙවත් කළමණාකරණයට මැදහත් වීම නවත්වා ගැනීමට නොහැකිනම් අපේක්ෂිත යහපත් ප්‍රතිඵල ලබාගත නොහැකිය.

රාජ්‍ය බාධක ඉවත් කිරීමෙන් විශාල ආයෝජනවලට දේශපාලන මැදිහත් වීම් මඟින් දැනට කෙරෙන බලපෑම අහෝසි වෙයි. ඒ සමඟ නිලධාරීන් දැනට භුක්ති විඳින වරප්‍රසාද ද අහෝසි වෙයි. ඒ අනුව ඔවුනට ලැබෙන අයුතු ලාභය අහෝසි වෙයි. එය ඔවුනට අසාධරණයක් සිද්ධ වන බව ඇත්තකි. මේ නිසා ඔවුහු ප්‍රතිව්‍යූහ ගත කිරීමට මැලිකමක් දක්වයි.

විදුලිබලය නිපදවීම බෙදා හැරීම නිදහස් තරඟකාරී වෙළෙඳ පොලක් තුළ සිදු කිරීමෙන් විදුලිය මිල පහත වැටෙන බැවින් පාරිභෝගිකයාට අත්වන්නේ වාසියකි. විදුලිය බල මණ්ඩලයද මෙම තරඟයට මුහුණ දිය යුතු බැවින් ඔවුන් තම කාර්යක්ෂමතාවය නංවාගන්නේ නැත්නම් පමණක් එහි පැවැත්මට තර්ජනයක් එල්ලවේ. එහෙත් රටේ ආර්ථික වර්ධනය කෙරෙහි ඇත්තේ අසීමිත වාසියකි. එය අවසානයේදී රටේ ජනතාවගේ යහපත සඳහා වූවකි.

ඉතින් මේ ශ්‍රේෂ්ඨ ජාතිය ප්‍රඥාවන්ත තීරණයක් ග න්නා තෙක්ම රටට අනාගතයක් නැත. මේ කරුමයෙන් ගැලවී නිදහස් වන්නට කල්පනා කරන කුඩා ජන වර්ගද එතෙක් මෙය ඉවසා සිටිය යුතුය. ඒකීය රාජ්‍යයක් හදන්නට තතනන අය එවන් උත්සාහයකට ඇති මෙවන් බාධා ඉවත් කර නොග න්නේ තමන් ඒ ගොඩ නඟනවා යැයි කියන ඒකීය රාජ්‍යය ගැනවත් යථාර්ථවාදී අවබෝධයක් නැති නිසා නොවේද? (අනුග්‍රහය-ලංකා ඊ නිව්ස්)